# කොළඹ මුස්ලිම් ජනතා ගැටලු විසඳන්න කරුණු දහයකින් යුත් වැඩපිළිවෙළක්

## කොළඹ පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ කියයි

කොළඹ නගරයේ ජීවත්වන මුස්ලිම් ජනතාවගේ ගැටලු විසඳීම සඳහා කරුණු දහයකින් යුතු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ නගරාධිපති ධූර අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා පැවැසීය.

කොළඹ ගාලු මුවදොර හෝටලයේ පැවැති උත්සවයක දී මේ වැඩසටහන නිල වශයෙන් එළිදැක්වීය.

කොළඹ සියළුම ජන කණ්ඩායම් අතර එකිනෙකාට ගරු කිරීම සහ එකිනෙකා පිළිබඳ අවබෝධය ඇති කරවන දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා සහාය වීම, මුස්ලිම් ජනතාවගේ සංස්කෘතිය සහ ජීවන ක්‍රමය පිළිබඳව අනෙකුත් ජනකොටස් අවබෝධයක් ඇතිකිරීම, මුස්ලිම් ජාතික පාසල්වල ප්‍රමිතිය නැංවීම සඳහා කටයුතු කිරීම සහ උසස් අධ්‍යාපනය සඳහා යොමුනොවන මුස්ලිම් තරුණ පිරිස් සඳහා වෘත්තිය පුහුණු පහසුකම් සැලසීම, හලාල් සහතික ලබාදීමට අදාළ සියලු කටයුතු සම්බන්ධයෙන් අධිකාරි බලය ලබාගැනීම සඳහා සමස්ත ලංකා ජම්මියාතුල් උලාමා සංවිධානයට සහායවීම, මුස්ලිම් ජනතාවට ඒ ඒ කාලයේ දී ඇතිවන ගැටලු සහ ප්‍රශ්න විසඳාගැනීම උදෙසා ආරක්ෂක අංශ ප්‍රධානීන් සහ පොලිසිය සමග 'මාසික හමුවක්' සංවිධානය කිරීමට සහායවීම, රාජ්‍ය සහ අනෙකුත් ආයතනවල යාඥා පහසුකම් ලබාගැනීමේ කාර්ය සඳහා සහාය වීම, පාසැල්, රෝහල් සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල දී නිල ඇඳුම වෙනුවට මුස්ලිම් කාන්තා ඇඳුම (හිජාබ්) ඇඳීමට අවස දෙන රාජ්‍ය චක්‍රලේඛය ක්‍රියාත්මක වන බවට සහතිකවීම, මුස්ලිම් ජන කොට්ඨාසයට ගැටළුවක් වී ඇති මත්ද්‍රව්‍ය ප්‍රශ්නය විසඳීම සඳහා උපකාරි වීම, කොළඹ පළාත් පාලන ආයතන කාර්යාලවල සහ පොලිසිය, රෝහල් සහ තැපැල් කාර්යාල වැනි රජයේ ආයතනවල මහජනතාව සමග ක්‍රියාකරන නිලධාරීන්ගේ ද්විඩ භාෂා දැනුම දියුණු කිරීම සඳහා සහාය වීම, කොළඹ නගරයේ මුස්ලිම් කාන්තාවන් සඳහා සැමියා මියගිය පසු ශෝකවන කාලපරිච්ඡේදයේ දී (ඉද්දා) දීමනාවක් ලබාදීමේ වගකීම සහිත විශේෂ අරමුදලක් පිහිටුවීමට කටයුතු කිරීම, එම කරුණු දහයයි.



මිලින්ද මොරගොඩ මහතා මුස්ලිම් ජනතාවගේ ගැටලු විසඳීම සඳහා වන කරුණු දහය එළිදැක්වීමේ රැස්වීමේ දී

මෙම යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාවට බස්නාහිර පළාත් ආණ්ඩුකාර අලෙවි මවුලානා, නියෝජ්‍ය අමාත්‍ය ෆයිසර් මුස්තපා, කොළඹ මහ නගර සභාවේ විශේෂ කොමසාරිස් ඔමාර් කාමිල් මහත්වරු ද සහභාගී වූහ.

මෙහිදී අදහස් දැක්වූ මිලින්ද මොරගොඩ මහතා කීවේ තමන් මෙම තොරතුර ඉදිරිපත් කරන්නේ මුස්ලිම් ආගමික නායකයන්, ප්‍රජා නායකයන් හා සාමාන්‍ය ජනතාව සමග කරන ලද සංවාදයකින් පසුව බව යි.